# ලංසු සඳහා ආරාධනයයි

## අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාතේ පාසල්වල ක්‍රියාකාරකම් කාමර සඳහා තොරතුරු තාක්ෂණ (IT) ආශ්‍රිත උපකරණ සැපයීම

1. සබරගමුව පළාතේ පාසල්වල ක්‍රියාකාරකම් කාමර සඳහා GEM ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය පහත සඳහන් උපකරණ සැපයීම සඳහා අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම් ලත් සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවනු ලැබේ.

**01. පාසල් ක්‍රියාකාරකම් මධ්‍යස්ථාන සඳහා**

| අයිතම අංකය | අයිතමය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණ ඇපකරය ( ශ්‍රී ලංකා රු.) |
|---|---|---|---|
| 01. | Desktop computer | 60 | Rs.150,000.00 |
| 02. | Laptop computer | 800 | මෙහි 8 වන ඡේදයේ සඳහන් පරිදි |

i. ගෙනවිත් භරදිය යුතු දිනය :- කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද දින සිට දින 60 ක් ඇතුලත
ii. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීම (NCB) යටතේ පැවැත්වේ.
iii. ලංසු කරුට ඉහත අයිතමයන් සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත්කල හැකිමුත් ආයිතම අංක 1 හි සම්පූර්ණ ඒකක ප්‍රමාණය සඳහාම ලංසු ඉදිරිපත් කළ යුතුය.
iv. අයිතම 2 සඳහා ලංසු කරුට සම්පූර්ණ ඒකක ප්‍රමාණය සඳහාම හෝ අදාල ඒකක ප්‍රමාණයන් 40හි ගුණාකාරවලින් (40,80,120......800 දක්වා) හෝ ලංසු ඉදිරිපත් කළ හැක. Laptop computer සඳහා ලංසු බැඳුම්කරයේ වටිනාකම ලංසු ඉදිරිපත් කරන ඒකක ප්‍රමාණය මත තීරණය වේ

2. මේ පිළිබඳ උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසු කරුවන්ට සබරගමුව පළාත් අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර ( දුරකථන අංක 045 2222542 /ෆැක්ස් අංකය 045 2228042 ) **2022/06/13 සිට 2022/07/01** දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා නොමිලේ ලංසු ලිපි ලේඛන පරික්ෂාකර බැලිය හැකිය.

3. **2022/06/13 සිට 2022/07/01** දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා පහත ලිපිනය වෙත ඉල්ලීමක් කර Desktop computer සඳහා රු. 3500.00 ක් හා Laptop computer සඳහා රු. 10,000.00ක ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු ලංසු ලේඛන කට්ටල ලබා ගත හැකිය.

4. *පූර්ව ලංසු රැස්වීමක් 2022/06/21 දින පෙ.ව. 10.00 ට සබරගමුව පළාත් සභාවේ, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ රැස්වීම් ශාලාවේ පැවැත්වේ.නොවැලක්විය හැකි හේතුවක් මත එදිනට එම රැස්වීම පැවැත්වීමට නොහැකි වුවහොත් එදිනම ZOOM තාක්ෂණය ඔස්සේ නියමිත වේලාවට පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ඒ සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන ලංසුකරුවන් 045-2228042 යන fax අංකයට 2022/06/20 දින පෙ.ව 11.00ට පෙර ලිපි මගින් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු අතර එවිට අදාල ලංසුකරුවන්ට* email මගින් zoom link ලබාදෙනු ලැබේ.

5. මුද්‍රා තබන ලද ලංසු අනුපිටපතක් සහිතව **2022/07/04** දින ප.ව 02.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් එවීමට හෝ මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාමරය ඉදිරිපිට තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මගින් සිදු කළ හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරණු ලැබේ. ලංසු ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහල කෙලවරේ "තොරතුරු තාක්ෂණ (IT) ආශ්‍රිත උපකරණ සැපයිම සඳහා ලංසු **GEMP- 2022** " ලෙස සඳහන් කල යුතුය. ලංසු විවෘත කිරිම ලංසු පත් භාර ගැනිම අවසාන වු වහාම සිදු කරනු ලබන අතර එම අවස්ථාවට ලංසු කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. (ලංසු කරුගේ නියෝජිතයෙකු ලංසු විවෘතය සඳහා සහභාගි වන්නේ නම් ඒ සඳහා බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ)

<u>ලංසු එවිය යුතු ලිපිනය-</u>

ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නවනගරය,
රත්නපුර.

6. ලංසු විවෘත කිරීමට නියමිත ඉහත දිනයේදී නොවැලක්විය හැකි හේතුවක් මත සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය ආශ්‍රිතව කාර්යාල කටයුතු සිදුකල නොහැකි වුවහොත් පමණක් එම දිනයේදී ලංසු විවෘතකිරීම සිදුනොකරනු ලබන අතර, නැවත මෙම ලංසු විවෘතකිරීම , රජයේ කාර්යාල විවෘතකරන ඊළග දිනයේ ප.ව.02.00 දක්වා ලංසු භාරගැනීම සිදුකර අවසන්වූ වහාම විවෘත කරනු ලැබේ.
7. සියළුම ලංසු **2022/10/04** දින දක්වා වලංගු විය යුතුය.

8. ලංසුව සමග **2022/ 07 / 04** දින සිට **2022/11/03** දින දක්වා පහත වගුවේ සඳහන් පරිදි වලංගු ලංසු බැදුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. එය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලේකම්, අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය , රත්නපුර නමින් හා කාරණය ලෙස "තොරතුරු තාක්ෂණ (IT) ආශ්‍රිත උපකරණ සැපයීම සඳහා ලංසු **GEMP-2022** " වශයෙන් ලබාගත් ලංසු බැදුම්කරයක් මගින් හෝ ලංසු බැදුම්කරයට අදාල මුදල මුදලින් තැන්පත් කරන්නේ නම් එම මුදල මෙම අමාත්‍යාංශය වෙත තැන්පත් කර ලබාගත් ලදුපතෙහි මුල් පිටපත ඉදිරිපත් කිරිම මගින් හෝ සිදුකළ හැක. යම් ලංසුකරුවෙක් අයිතම දෙකටම ලංසු ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙන ලංසු බැදුම්කර ඉදිරිපත් කල යුතුය. එමෙන්ම ලංසුකරුට අයිතම අංක 02 ට අදාල ලැප්ටොප් පරිගණක සඳහා ඉල්ලා ඇති මුළු ඒකක ප්‍රමාණයට හෝ 40 ගුණාකරයෙන් ( 40, 80, 120, .............800 දක්වා) ලංසු ඉදිරිපත් කල හැකිය. ලැප්ටොප් පරිගණක සඳහා ලංසු සුරක්ෂණයේ වටිනාකම පහත වගුවේ සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කරන ඒකක ප්‍රමාණය අනුව පදනම් වේ.

| අයිතම අංකය | උපකරණයේ නම | ඒකක ප්‍රමාණය | ලංසු බැඳුම්කරයේ වටිනාකම (රු) |
|---|---|---|---|
| 01 | Desktop Computers | 60 | 150,000.00 |
| 02 | Laptop computers | 40 | 120,000.00 |

| | | | |
|---|---|---|---|
| | | 80 | 240,000.00 |
| | | 120 | 360,000.00 |
| | | 160 | 480,000.00 |
| | | 200 | 600,000.00 |
| | | 240 | 720,000.00 |
| | | 280 | 840,000.00 |
| | | 320 | 960,000.00 |
| | | 360 | 1,080,000.00 |
| | | 400 | 1,200,000.00 |
| | | 440 | 1,320,000.00 |
| | | 480 | 1,440,000.00 |
| | | 520 | 1,560,000.00 |
| | | 560 | 1,680,000.00 |
| | | 600 | 1,800,000.00 |
| | | 640 | 1,920,000.00 |
| | | 680 | 2,040,000.00 |
| | | 720 | 2,160,000.00 |
| | | 760 | 2,280,000.00 |
| | | 800 | 2,400,000.00 |

9. මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුවේ.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව,
අධ්‍යාපන,තොරතුරුතාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර
045-2222542
2022.06.09